# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE


මගේ අංකය / எனது இல. / My No. } එස්පීඑල්පී/කේජී/ඒ/වයිපීඑස්/එෆ්ඒ/05/2022/32

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2023 මැයි [illegible] දින

ලේකම්,

යටියන්තොට ප්‍රාදේශීය සභාව.

යටියන්තොට ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(I) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

යටියන්තොට ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස් වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට යටියන්තොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පරිගණක මිළ දී ගැනීමක් සඳහා ගිවිසුම්ගතව නොතිබිය දී රු.900,000ක් වෙන් කිරීම සිදු කිරීම නිසා එම ප්‍රමාණයෙන් ලාභය අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ පොහොර නිෂ්පාදනයේ ඌනතාව වූ රු.1,583,588ක් ආදායම් වියදම් ගිණුමට මාරු කළයුතු වුවද, එය සමුච්චිත අරමුදලට හර කිරීම නිසා වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) කඩකාමර බදු දීමේ දී 2020 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ලද පෙර ගෙවුම් මුදල් (key money), ආදායම් ලෙස හඳුනා නොගෙන පොදු තැන්පත් යටතේ ගිණුම්ගත කිරීම නිසා සමුච්චිත අරමුදල රු.7,079,940 කින් ද, වර්ෂයේ ලාභය රු.10,411,945 කින්ද අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) පැති බැම්මක් ඉදිකිරීමේ පළමු අදියර සඳහා 2021 වර්ෂයේ එළැඹ තිබුණු ගිවිසුම 2022 දෙසැම්බර් 31 දින අවලංගු කර තිබියදී රු.1,000,000 ක් ණයහිමියන් ලෙස දැක්වීම නිසා එම ප්‍රමාණයෙන් සමුච්චිත අරමුදල අඩුවෙන්ද ණයහිමියන් වැඩියෙන්ද දක්වා තිබුණි.

(ඉ) කට්ටිකර විකිණීම අවසන්ව තිබුණු ඉඩමකට අදාළ රු.784,000ක් වූ සියයට 1ක තැන්පත් මුදල ආදායමට ගෙන නොතිබුණි. එහි ඉඩම් කට්ටි 42ක සත්‍ය විකුණුම් වටිනාකම මත රු.100,970ක් තවදුරටත් සභාවට අයවිය යුතු ලෙස හඳුනාගෙන තිබුණද, එය ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) පරිත්‍යාග ලෙස 2019 වර්ෂයේ ලද මාර්ග පිරිසිදු කිරීමේ යන්ත්‍රයක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව එක් ගිණුම් විෂයයක ශේෂය, උපයෝගී ලේඛන සමඟ සැසඳීමේදී රු.18,700ක වෙනසක් පැවැතිණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- ප්‍රකාශකරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත

විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.5 අනුකූල නොවීම

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 154 (1) වගන්තිය | 2003 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා කාලය තුළ ඉඩම 08ක් කට්ටිකර විකිණීමේදී එහි තක්සේරු අගය මත සියයට 01ක මුදලක් භූභාවේ තැන්පත් කර තිබුණි. එහෙත්, විකුණුම් වටිනාකම මත අයවිය යුතු මුදල ගණනය කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධි විධාන ) පනත | පනතේ උපලේඛන යටතේ මුද්දර ගාස්තු අයකළ යුතු ලියකියවිලි සඳහන් කර තිබුණි. එහෙත්, ඊට පටහැනිව 2020 වර්ෂයේ සිට 2022 වර්ෂයේ දෙවන කාර්තුව දක්වා කාලය තුළ දේපළ කුලියට දීමේ ආදායමෙන් සියයට 01ක මුද්දර ගාස්තු ලෙස රු.110,010ක් අයකර තිබුණි. |
| (ඇ) 1988 ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන) රීති අංක 59 හා 67 | සෑම වර්ෂයකම ආරම්භයේදී ව්‍යාපාර බදු හා බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකළ යුතු වුවද, 2021 හා 2022 වර්ෂ සඳහා එසේ සිදුකර නොතිබුණු බැවින් එකතු කළ ආදායම රු.860,326ක් පමණක් වාර්ෂික ආදායම ලෙස සලකා තිබුණි. |
| (ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි571 | වසර 2 ක් ඉක්මවූ ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් ඇප තැන්පතු 20 ක වටිනාකම රු. 98,600ක් ආදායමට ගෙන නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 17,784,468 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 11,989,012 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත්කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කල ආදායම් | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 4,306,642 | 4,475,968 | 4,262,495 | 1,204,536 | 4,774,648 | 4,472,797 | 4,572,798 | 975,863 |
| කුලී | 8,479,900 | 7,874,817 | 8,417,067 | 153,951 | 8,800,960 | 5,611,520 | 4,809,011 | 606,638 |
| බලපත්‍ර ගාස්තු | 850,050 | 957,409 | 967,009 | - | 725,050 | 931,452 | 118,900 | 9,600 |
| වෙනත් ආදායම් | 5,139,700 | 8,413,354 | 7,458,054 | 1,204,735 | 4,404,500 | 2,176,642 | 2,033,024 | 354,198 |
| | 18,776,292 | 21,721,548 | 21,104,625 | 2,563,222 | 18,705,158 | 13,192,411 | 11,533,733 | 1,946,299 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

(අ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ ආදායම රු.1,946,299ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම රු. 21,721,548ක් විය. ඒ අනුව වර්ෂය තුළ රැස්කළ යුතු සමස්ථ ආදායම රු. 23,667,847ක් වුවද, 2022 හා 2023 වර්ෂවලදී රැස් කරන ලද ආදායම රු. 21,965,328ක් වීමෙන් තවදුරටත් රැස්කළ ගතයුතු සමස්ථ ආදායම ප්‍රතිශතයක් ලෙස සියයට 7.19ක මට්ටමක පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කළ ආදායම සමඟ සැසඳීමේදී වරෙන්තු හා දඩ, වෙනත් ආදායම් යන ආදායම් විෂයයන්ගෙන් රැස්කළ ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 282.26කින් හා 354.18 කින් වැඩි වී තිබූ අතර, බලපත්‍ර ගාස්තු යන ආදායම් විෂයයේ රැස්කළ ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා සියයට13.76 කින් අඩු වී තිබුණි.

2.2.3 වරිපනම් හා බදු

------------------

(අ) වරිපනම්

----------

සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු හිඟ වරිපනම් බදු ශේෂය රු.1,150,697ක් වූ අතර, එම ශේෂය තුළ වසර 01ත් 05 ත් අතර කාලයක් හිඟව පවතින රු.546,355ක ශේෂයක් ද වසර 05ට වැඩි රු. 22,060ක ශේෂයක් ද විය.

(ආ) අක්කර බදු

------------

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ අක්කර බදු ශේෂය රු. 53,840ක් වූ අතර, එම ශේෂය තුළ වසර 01ත් 05 ත් අතර කාලයක් හිඟව පවතින රු. 18,355ක ශේෂ විය.

2.2.4 කුලී

-----

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ කුලී ශේෂය රු. 153,951න් තව දුරටත් අයවිය යුතු ශේෂය රු. 100,126ක් වන අතර, එම ශේෂය තුළ වසර 01ත් 05ත් අතර කාලයක් හිඟව පවතින රු. 76,188ක ශේෂ විය.

2.3 නීතිරීති යථාවත් නොකිරීම හේතුවෙන් අත්හැරුණු ආදායම

------------------------------------------------------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 හා 152(1) වගන්ති මගින් නියම කළ ව්‍යාපාර බලපත්‍ර ගාස්තු හා ව්‍යාපාර බදු අනුප්‍රමාණ වසර 35කට වඩා පැරණි විය. එහෙත්, ඒවා සංශෝධනය කර නොගැනීම නිසා අයකරගත හැකි ආදායම් අහිමි වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශිය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබද කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුව විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරිම පිළිබදව නිරික්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ක්‍රියාකාරි සැලැස්ම

වැඩසටහන් 13 කට අදාළව හඳුනාගත් උප ක්‍රියාකාරකම් 128 කින් ක්‍රියාකාරකම් 74 ක් ඉටුකිරීමට සභාව අපොහොසත් වී තිබුණි.

(ආ) ඉටු නොකළ ව්‍යාපෘති

(i) "ගම සමඟ පිළිසඳර" වැඩසටහන යටතේ ලද රු.6,790,000ක ව්‍යාපෘති 17ක්, කාලය ප්‍රමාණවත් නොවන බවට හේතු දක්වා සභාව විසින් අවලංගු කර තිබුණි.

(ii) අයවැය වාර්තාව අනුව, 2022 වර්ෂයේ මංමාවත් කොන්ක්‍රීට් කිරීම සඳහා වෙන් කළ රු.10,000,000ක ප්‍රතිපාදනයෙන් සියයට 35ක් එනම්, රු.3,451,032ක කර්මාන්ත 14ක් පමණක් ඉටුකර තිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත කරුණු නිරික්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ බැංකු ගිණුම් 2ක පැවති රු.13,723,816ක ශේෂය කෙටිකාලීන ආයෝජනයක හෝ යොදවා ආදායම් උපයාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වසර 01ත් වසර 04ත් අතර පැරණි රු.6,820,484ක් ශේෂ ණයගිම් ශේෂය තුළ පැවතිණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2021 පෙබරවාරි 01 දිනැති අංක 03/2020 දරන සබරගමුව පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 14 වගන්තියට පටහැනිව, යටියන්තොට හා කිතුල්ගල මාළු වෙළඳසැල් 03ක් බදු දීමේ දී අවම ලංසුව රජයේ තක්සේරුකරු මගින් ලබා ගෙන නොතිබුණි. එම දේපළ වෙනුවෙන් රජයේ තක්සේරුවක් හෝ සිදුකර නොතිබුණු අතර ඉකුත් වර්ෂයේ ලංසු වටිනාකම, අවම ලංසුව ලෙස සලකා ලංසු කැඳවීම් කර තිබුණි. එමෙන්ම, කිතුල්ගල මාළු වෙළඳසැල 2015 වර්ෂයේ සිට සිට 2021 වර්ෂය දක්වා අඛණ්ඩව එකම ලංසුකරුවකු වෙත බදු දී තිබුණි.

(ආ) ආදායම හෝ ඵලදාව පිළිබඳ ඇගයීමක් සිදු නොකර, අවම ලංසු වටිනාකම සුළු වශයෙන් වැඩිකර හෝ එම වටිනාකම එලෙසම ඉදිරිපත් කර හෝ ගරාගොඩ ගලපල්ලවත්ත ඉඩම එකම ලංසුකරුවෙකු වෙත 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා බදු දී තිබුණි.

(ඇ) කිතුල්ගල සංචාරක ප්‍රදේශය සඳහා 2021 වර්ෂයේ දී ඉදිකළ රු.1,950,822ක් වටිනා වෙළඳ කුටි 14ක් 2022 ඔක්තෝබර් වනවිටත් අභාවිතව පැවතුණි.

(ඈ) ප්‍රදර්ශිත දැන්වීම් පුවරු හඳුනාගැනීමට සමාලෝචිත වර්ෂය තුළ සමීක්ෂණයක් සිදුකර ඉන් පසු බිල් කිරීම කර නිවැරදි ආදායම හඳුනාගෙන නොතිබුණි. ඒ වෙනුවට වර්ෂය තුළ එකතු කරගත් රු.97,075ක් වර්ෂයේ ආදායම ලෙස සලකා තිබුණි.

3.4 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සේවක පුරප්පාඩු

------------------

සභාවේ අනුමත තනතුරු 13 ක පුරප්පාඩු 27 ක් පැවතුන අතර, ඉන් තනතුරු 2 ක් සඳහා 10 දෙනෙකු සේවා ගිවිසුම් මත බඳවා ගෙන තිබුණද. ඉතිරි පුරප්පාඩු විගණිත දින වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සේවක ණය

සභාවේ සේවකයින් 33 දෙනෙකුගෙන් අයවිය යුතු, 1985 සිට 2015 දක්වා කාලයට අදාළ රු.172,424 ක ණය ශේෂයෙන් තව දුරටත් අයවිය යුතු රු. 169,423ක ශේෂයක් පැවතුණි.

3.5 වත්කම් කළමනාකරණය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු දේපළ 02ක් 2020 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ බදු දී නොතිබීම නිසා එහි අවම ලංසු වටිනාකම වූ රු.302,500ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

(ආ) ඉඩමක් අනුබෙදුම් කර අනුමත කිරීමට පෙර මාර්ග හා විථි සභාව වෙත පවරා ගත යුතු වුවද, 2005 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා කට්ටි කළ ඉඩම් 05කින් එසේ පවරා ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ඇ) ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණු රු.16,455,000 ක් වූ වාහන 09 ක් සහ වටිනාකම රු.3,200,000 ක් වූ බොබ්කැට් යන්ත්‍රයක් 2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 2(i) පරිදි පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි

(ඈ) වටිනාකම රු.11,302,500 ක් වූ වාහන 07 ක්, බැකෝ යන්ත්‍රයක්, හා ජල බවුසරයක් වසර 01 සිට වසර 13 දක්වා කාලයක සිට අක්‍රියව පවතින නමුත්, 2020 ඔක්තෝබර් 02 දිනැති අංක 05/2020 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛ පරිදි එම වත්කම් අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සභාව සතු ඉඩම් 18 ක් 2017 අගෝස්තු 16 දිනැති අංක .04/2017 දරන සබරගමුව පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛයට පටහැනිව කමිටුවක් මගින් සිදුකරන ලද තක්සේරුව පදනම්කරගෙන රු.69,636,100 ක වටිනාකමට ගිණුම්ගත කර තිබුණි.

(ඊ) මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණු ඉඩම් 12 ක වටිනාකම රු.52,347,600 ක් හා වටිනාකම රු.2,772,172 ක් වූ ගොඩනැගිලි 3 ක් ස්ථාවර වත්කම් ලේඛනයේ දක්වා නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 අයවැය පාලනය

පහත සඳහන් කරුණු හේතුවෙන් වාර්ෂික අයවැය මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

(අ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 05 කට අදාළව එකතුව රු. 475,600ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 30 කට අදාළව එකතුව රු19,743,600ක් වූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 20 සිට සියයට 94 දක්වා පරාසයක ඉතිරිවීම් පැවැතිණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 18ක රු. 27,771,519ක් වූ මුළු ප්‍රතිපාදනය ඉක්මවා රු. 15,296,160ක් වැයකර තිබුණු අතර ඒ සඳහා ප්‍රතිපාදන මාරුකර ගැනීමට හෝ අතිරේක ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙසේ ප්‍රතිපාදන ඉක්මවීම සියයට 09 සිට සියයට 931ක දක්වා පරාසයක පැවැතිණි.

ඩී.පී.එම්.කුමානායක,

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,

විගණකාධිපති වෙනුවට.